ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


## සන්නිවේදන දෙපාර්තමේන්තුව

30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| දිනය | **2018.11.27** |

**සංසරණය සඳහා නව කාසි කාණ්ඩයක් නිකුත් කිරීම**

කාසි ටංකන පිරිවැය අඩු කිරීම, කල් පැවැත්ම, පහසුවෙන් රැගෙන යා හැකි බව හා දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට කාසි වර්ග වෙන්කර හඳුනාගැනීම පහසු කරවීම යන පරමාර්ථ ඇතිව මුහුණත වටිනාකම රු.10, රු.5, රු.2 හා රු.1 යන කාසි වර්ග හතරින් යුත් නව කාසි කාණ්ඩයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදී. මෙහි පළමු කාසි ඇසුරුම 2018.11.27 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් ගරු අග්‍රාමාත්‍ය හා මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත නිල වශයෙන් පිළිගන්වනු ලැබීය.

නව කාසි කාණ්ඩයේ කාසි 2018.12.03 දින සිට බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා සංසරණයට නිකුත් කරනු ලබන අතර අනෙකුත් ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සමග ගෙවීම් සඳහා භාවිතා කළ හැකි වේ.

**නව කාසි කාණ්ඩයේ ලක්ෂණ**

නව කාසි කාණ්ඩයේ කාසි වර්ග හතරම අනෙකුත් ලෝහවලට වඩා අඩු මිලක් ඇති සහ ලෝහාලේපිත කාසි වලට වඩා වැඩි කල් පැවැත්මක් ඇති මල නොබැඳෙන වානේවලින් නිෂ්පාදනය කර ඇත. කාසිවල විෂ්කම්භය හා ඝනකම කාසියේ වටිනාකම සමග වැඩිවන අනුපිළිවෙළට වෙනස් කර ඇති අතර පහසුවෙන් රැගෙන යා හැකි පරිදි කාසිවල බර අඩු කර ඇත. තවද, දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට මෙම කාසි වර්ග එකිනෙකින් වෙන්කර පහසුවෙන් හඳුනා ගැනීමට එකිනෙකින් වෙනස් වූ දාර යොදා ඇත.

**කාසි පිළිබඳ විස්තර**

| කාසි වර්ගය | ලෝහය | විෂ්කම්භය | ඝනකම | හැඩය | දාරය |
|---|---|---|---|---|---|
| රු.10 | මල නොබැඳෙන වානේ | මි.මී. 26.4 | මි.මී. 1.80 | වටකුරු | කට්ට 11 ක් සහිත |
| රු. 5 | මල නොබැඳෙන වානේ | මි.මී. 23.5 | මි.මී. 1.80 | වටකුරු | සාමාන්‍ය ලෙස කට්ට සහිත |
| රු. 2 | මල නොබැඳෙන වානේ | මි.මී. 22.0 | මි.මී. 1.75 | වටකුරු | ගැඹුරු කට්ට සහිත |
| රු. 1 | මල නොබැඳෙන වානේ | මි.මී. 20.0 | මි.මී. 1.75 | වටකුරු | දුරින් දුර කට්ට සහිත |

**කාසියේ මුහුණත**

**සාමාන්‍ය පරිදි මෙම කාසිවල මුහුණතේ රාජ්‍ය ලාංඡනය ද, කාසියේ පරිධියේ ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂාවලින් "ශ්‍රී ලංකා" ලෙස දැක්වේ. "2017" වර්ෂය රාජ්‍ය ලාංඡනයට පහළින් දැක්වේ.**

**කාසියේ පිටුපස**

**කාසියේ පිටුපස මධ්‍යයේ එහි මුහුණත වටිනාකම විශාල ඉලක්කමෙන් ද සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් වචනයෙන් ද දක්වා ඇත. කාසිවල පරිධියේ නෙළුම් මල් පෙති මෝස්තරයක් යොදා ඇත.**

| **කාසි වර්ගය** | **රු.1** | **රු.2** | **රු.5** | **රු.10** |
|---|---|---|---|---|
| **කාසියේ මුහුණත** |  |  |  |  |
| **කාසියේ පිටුපස** |  |  |  |  |

**වැඩි විස්තර සඳහා;**

**ශ්‍රී ලංකා මහ බැංකුව : දුරකථන අංකය :** 0112477587/ 0112477369
**විද්‍යුත් තැපැල :** currency@cbsl.lk

**අධිකාරි**
**ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**නො. 30, ජනාධිපති මාවත**
**කොළඹ 01**
**ශ්‍රී ලංකාව.**